**කැලණිය විශ්වවිද්‍යාලය 2015**

---------------------------------------------

කැලණිය විශ්වවිද්‍යාලයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් විශ්වවිද්‍යාලයේ උපකුලපති වෙත 2016 මැයි 24 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වැනි වගන්තිය ප්‍රකාර විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට කැලණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07**

දේපල, පිරියත හා උපකරණවල සාධාරණ වටිනාකම් එහි ධාරණ අගයෙන් සැලකිය යුතු තරම් වෙනස්වීම්වලින් යුක්ත වන්නේ නම් ප්‍රත්‍යාගණනය කිරීම අවශ්‍ය වුවත් 2015 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.654,759,142 ක් ලෙස දක්වා ඇති විශ්වවිද්‍යාලයට නීත්‍යානුකූල අයිතිය ඇති ඉඩම් 2009 වර්ෂයෙන් පසු ප්‍රත්‍යාගණනය කර සාධාරණ වටිනාකම ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 සම්බන්ධිත පාර්ශවයන් සමඟ ඇති ගණුදෙනු හෙළිදරව් නොකිරීම**

විශ්වවිද්‍යාලයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ අධ්‍යක්ෂ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ පිහිටු වන ලද Lanka Education And Research Network (LEARN) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් කටයුතු කරන අතර විශ්වවිද්‍යාලය විසින් එම සමාගමෙන් අන්තර්ජාල පහසුකම් ලබා ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

සමාලෝචිත වර්ෂයේ බැංකු ගිණුම් දෙකකට සෘජුවම බැර කරන ලද රු.1,627,334 ක් එම ගනුදෙනුවේ ස්වභාවය හා කාලය හඳුනා ගැනීමකින් තොරව ගෙවිය යුතු මුදලක් ලෙස ගිණුම් ගත කර තිබුණි.

**2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවක ණය හා අත්තිකාරම් ශේෂය මූල්‍ය ප්‍රකාශන වලට අනුව රු.4,822,092 ක් වූ අතර උපලේඛනවලට අනුව එය රු.4,943,292 ක් වූයෙන් රු.121,200 ක ශුද්ධ වෙනසක් නිරීක්ෂණය විය.

**2.3 ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රඳවා ගැනීමේ බදු රු.252,214 ක් වසර 02 කට වඩා වැඩි කාලයක සිට දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය නොකර ගිණුම්වල රඳවා තිබුණි.

(ආ) 2006 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා නිම කරන ලද කොන්ත්‍රාත් කටයුතුවලට අදාල රඳවා ගැනීමේ මුදල් රු.3,327,691 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 70 වන වගන්තිය | උපාධි අභිඥන පත්‍ර හෝ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා සඳහා ඉගැන්වීමේ කටයුතු සැලැස්වීම හෝ විභාග පැවැත්වීම විශ්වවිද්‍යාලයේ කාර්යය වුවද එයට පරිබාහිරව ආයතනයේ සම්පත් උපයෝගී කර ගනිමින් සමාලෝචිත වර්ෂයේදී කෙටි කාලීන සහතික පත්‍ර පාඨමාලා 33 ක් පවත්වා තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 371 (2) (ඇ) | තත්කාර්ය අතුරු අග්‍රිමයන් එය දෙන ලද කාර්යය නිමකළ විගසම පියවීමට කටයුතු කළයුතු වුවත් 2007 වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂය තුළදී නිලධාරීන් 6 දෙනෙකු වෙත ලබාදී තිබූ ජාත්‍යන්තර සමුළු අත්තිකාරම් එකතුව රු.727,844 ක් හා දර්ශණ විශාරද උපාධි (PhD) පර්යේෂණ සඳහා සමාලෝචිත වර්ෂය තුළදී නිලධාරීන් 3 දෙනෙකු වෙත ලබා දෙන ලද රු.3,500,000 ක ප්‍රාග්ධන අත්තිකාරම් මුදල් 2016 මැයි 31 දින වන විටත් පියවා නොතිබුණි. |
| (ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය<br>XX වන පරිච්ඡේදයේ 3(1)වගන්තිය සහ X පරිච්ඡේදයේ 1.6.1 වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා නිවාඩු තහවුරු කර නොගෙන වැටුප් හා දීමනා වශයෙන් රු.1,137,569,476 ක් ගෙවා තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | (i) | යොමුගත චක්‍රලේඛයට පටහැනිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ ලිපි පදනම් කරගෙන මාණ්ඩලික නිලධාරීන්ගේ මූලික වැටුපෙන් සියයට 8 සිට සියයට 20 දක්වා එකතුව රු.1,841,209 ක් සංග්‍රහ වියදම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි. එසේ ගෙවා තිබියදී කාර්යාලවල හා පොදු සංග්‍රහ කටයුතු වෙනුවෙන් එකතුව රු.1,656,057 ක් විශ්වවිද්‍යාල අරමුදලින් ද ගෙවා තිබුණි. |
| | | (ii) | අමාත්‍ය මණ්ඩලය, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හෝ භාණ්ඩාගාරය විසින් නිශ්චිතවම අනුමත කරන ලද ප්‍රතිලාභ පමණක් තම පාලක මණ්ඩලවල අනුමැතිය ඇතිව ගෙවිය හැකි වුවත් ඊට පටහැනිව ආර්ථික විද්‍යා අධ්‍යයන අංශයේ ආධුනික කථිකාචාර්යවරයෙකුට පත්වීම ලැබූ දින සිට වසර තුනක් ඇතුලත දැවුරුදු පශ්චාත් උපාධිය සම්පූර්ණ කිරීම වෙනුවෙන් පාලක මණ්ඩලයේ අනුමැතිය මත රු.100,000 ක දිරිදීමනාවක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. |
| (ඉ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 7.4.5 ඡේදය | | අවසන් වරට 2012 වර්ෂයේදී පුස්තකාල පොත් සමීක්ෂණයක් සිදු කර තිබුණද විගණිත දිනය වූ 2016 මැයි 31 දින දක්වාම සමීක්ෂණ වාර්තාව පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.474,804,754 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.122,261,416 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.352,543,338 කින් වර්ධනය වී තිබුණි. බාහිර විභාග ආදායම් රු.259,259,930 කින් හා ගාස්තු අය කිරීමේ පාඨමාලා ආදායම් රු.37,866,698 කින් වැඩිවීම හා අනෙකුත් පුනරාවර්තන වියදම් රු.46,077,661 කින් අඩුවීම ඉහත වර්ධනය කෙරෙහි විශේෂයෙන් බලපා තිබුණි.

### 3.2 දායකත්වය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සමඟ ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2015 වර්ෂය දක්වා අඛණ්ඩව අතිරික්තයක් ඇති වී තිබුණි. සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සැලකිල්ලට ගැනීමේදී විශ්වවිද්‍යාලයේ දායකත්වය 2012 වර්ෂයේ සිට 2015 දක්වා අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කළද, 2014 වර්ෂයේ දායකත්වය 2013

වර්ෂය හා සැසඳීමේදී සියයට 70 කින් අඩු වී තිබුණි. 2015 වර්ෂයේදී නැවත දායකත්වය සියයට 800 කින් වර්ධනය වී තිබුණි.

(ආ) පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී දායකත්වය වැඩිවීම කෙරෙහි බාහිර විභාග ආදායම් සියයට 113 කින් වැඩිවීම හා ගාස්තු අයකර පවත්නා පාඨමාලා ආදායම් සමාලෝචිත වර්ෂයේදී සියයට 25 කින් වැඩිවීම සහ කාලය දීර්ඝ කිරීමේ ගාස්තු වැඩිවීම වැනි කරුණු බලපා තිබුණි. බාහිර පාඨමාලා ආදායම් වැඩිවීම සඳහා පාඨමාලා ගාස්තු ඉහළ නංවා තිබීම හා බඳවා ගත් සිසුන් සංඛ්‍යාව 2015 වර්ෂයේදී 10,000 කින් වැඩිවීම බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධ්‍යයන කාර්ය සාධනය

2005/2006 අධ්‍යයන වර්ෂයේදී වෛද්‍ය පීඨය සඳහා බඳවා ගත් සිසුන් සංඛ්‍යාව 198 ක් වන අතර එය ක්‍රමයෙන් අඩුවෙමින් 2014/2015 අධ්‍යයන වර්ෂයේදී 168 ක් පමණක් බඳවා ගැනීමට කටයුතු කර තිබුණි. ඒ අනුව බඳවා ගැනීම් ප්‍රතිශතය සියයට 15 කින් පමණ අඩුවී තිබුණු අතර පවතින සම්පත් උපයෝගී කර උපරිම දේශීය සිසුන් සංඛ්‍යාවක් බඳවා ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) පර්යේෂණ ප්‍රගතිය

(i) විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සිදු කරන පර්යේෂණ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම වැදගත් කාර්යයක් වන අතර විශ්වවිද්‍යාලයේ පර්යේෂණ කමිටුව විසින් 2015 වර්ෂය වෙනුවෙන් පර්යේෂණ ව්‍යාපෘති 26 ක් අනුමත කර ඒ වෙනුවෙන් රු.6,685,000 ක් වෙන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

- අනුමත ව්‍යාපෘති වලින් ව්‍යාපෘති 21 ක් පමණක් ආරම්භ කර තිබුණද ඒ සඳහා වෙන් කර තිබූ රු.5,490,000 ක මුදලින් වැය වී තිබුණේ රු.1,659,526 ක් එනම් සියයට 30 ක් පමණි.

- ක්‍රියාත්මක ව්‍යාපෘති 21 න් ව්‍යාපෘති 11 ක පමණක් ප්‍රගති වාර්තා ඉදිරිපත් කර තිබුණි.

(ii) 2015 වර්ෂයේ පර්යේෂණ දීමනා සඳහා රු.105,000,000 ක් වෙන්කර තිබුණ අතර විශ්වවිද්‍යාලය විසින් පර්යේෂණ ප්‍රගතිය පිළිබඳ නිසි ඇගයීමක් සිදු කිරීමකින් තොරව ආචාර්යවරුන් හා නිළධාරින් 585 දෙනෙකු සඳහා ප්‍රතිපාදිත මුදල ඉක්මවා රු.8,307,951 ක් ගෙවා තිබුණි.

(iii) ලෝක ශ්‍රේණිගත කිරීම අනුව කැලණිය විශ්වවිද්‍යාලය 2015 දෙසැම්බර් වන විට 3,087 තත්ත්වයේ පැවතියද 2016 මැයි වන විට 2,815 දක්වා ඉහළ යාමක් නිරීක්ෂණය විය.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලය විසින් වර්ෂ 20 කට වැඩි කාලයක සිට ප්‍රයෝජනයට ගනු ලබන ඉඩම් කැබලි 11ක අයිතිය 2016 අප්‍රේල් 30 දක්වාම පවරා ගැනීමට අපොහොසත්ව තිබුණි.

(ආ) බදු පදනම මත විශ්වවිද්‍යාලය සන්තකය දරමින් සිටින රාගම වෛද්‍ය පීඨය පිහිටා තිබෙන රජයට අයත් අක්කර 32 රූඩ් 5 පර්චස් 64 ක ඉඩමේ කැබලි 05 ක් විශ්වවිද්‍යාලයට විධිමත්ව පවරා ගෙන නොතිබුණි.

(ඇ) ශාස්තෘ අයකර පවත්වනු ලබන පාඨමාලා සඳහා විශ්වවිද්‍යාලය විසින් පිළියෙල කර තිබෙන නිර්ණායකය අනුව පාඨමාලාවලින් ලැබෙන ආදායමෙන් සියයට 10 ක් පීඨයේ සංවර්ධන අරමුදලට බැර කළ යුතු වුවද එම ප්‍රමාණය ඉක්මවා රු.23,743,886 ක් පීඨ සංවර්ධන අරමුදලට මාරු කර තිබුණි. තවද පාඨමාලා ආදායමෙන් සියයට 5 ක් රජයේ ආදායමට මාරු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දී රජයේ ආදායමට ගෙන තිබුණේ සියයට 4 ක් පමණි. එසේම උපකුලපති අරමුදලට මුදල් බැර කිරීමට අනුමැතිය නොතිබියදී පාඨමාලා ආදායමෙන් සියයට එකක් එම අරමුදලට බැර කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ සප්ත වාර්ෂික නිවාඩු ලබා රාජ්‍ය ආයතන වල සේවයේ යෙදෙන ආචාර්යවරුන් දෙදෙනෙකුට විශ්වවිද්‍යාලය හා එම ආයතන දෙකෙන්ම රු.10,000 ක අන්තර් දීමනාව සහ සියයට 20 අමතර දීමනාව ගෙවා තිබූ අතර තවත් ආචාර්යවරයෙකු සඳහා ඉහත දීමනා දෙකට ද අමතරව ජීවන වියදම් දීමනාවද, සියයට 15 හා සියයට 05 විශේෂ දීමනාවන් ද ආයතන දෙකෙන්ම ගෙවා තිබුණි. මේ අනුව 2015 දෙසැම්බර් මාසයට අදාලව සිදු කරන ලද විගණන පරීක්ෂාවේදී ආචාර්යවරුන් තිදෙනා වෙනුවෙන් වැටුපට අමතරව විශ්වවිද්‍යාලය මඟින් රු.71,770 ක් ද සේවයේ නියුතු අනිකුත් රාජ්‍ය ආයතන වලින් රු.71,890 ක් ද දීමනා ලෙස ගෙවා තිබුණි. එකම දීමනාව දෙවරක් ගෙවීම පිළිබඳව කළමනාකරණය විසින් අදාල ආයතන විමසා කටයුතු කර නොතිබුණි.

තවද සප්ත වාර්ෂික නිවාඩු ලබා සිටි ඉහත ආචාර්යවරුන් වෙත සමාලෝචිත වර්ෂයේදී මෙම විශ්වවිද්‍යාලයේ සේවයේ යෙදී නොසිටි කාලය වෙනුවෙන් අධ්‍යයන දීමනා රු.2,084,656 ක් හා පර්යේෂණ දීමනා රු.602,353 ක් විශ්වවිද්‍යාලය විසින් ගෙවා තිබුණි.

## 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ 10 වන පරිච්ඡේදයේ 33 වන ඡේදය ප්‍රකාරව 2015 දෙසැම්බර් 31 දිනට ගිවිසුම් කඩකළ ආචාර්යවරුන් 19 දෙනෙකුගෙන් රු.61,933,498 ක මුදලක් අය විය යුතු බව නිරීක්ෂණය වූ අතර එයින් 14 දෙනෙකුම ආධුනික කථිකාචාර්යවරුන් විය. ආචාර්යවරුන් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු.5,974,527 ක් සඳහා විශ්වවිද්‍යාලය විසින් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් සිටින අතර ඉදිරියේදී ඒ සඳහා මූල්‍යමය වශයෙන් අතිරේක වැය බරක් දැරීමට සිදු විය හැකි බව නිරීක්ෂණය විය. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයට අනුව බැඳුම්කර වටිනාකම වාරික 48 කින් අය කළ හැකි වුවත් වාරික ප්‍රමාණය තීරණය කිරීමේදී අයවිය යුතු මුදලින් ඉතා කුඩා වාරික වශයෙන් ගෙවීමට ද එකඟ වීම නිසා මුදල් අයවීමේ දී වර්ෂ 10 සිට වර්ෂ 15 අතර දිගු කාල පමාවක් සිදුවන බවට නිරීක්ෂණය විය.

(ආ) කථිකාචාර්යවරයෙකුට 2012 දෙසැම්බර් 14 දින (MBA Industry visit) ලබා දෙන ලද රු.250,000 ක් වූ විවිධ අත්තිකාරම් මුදල් විගණිත දිනය වූ 2016 මැයි 31 දක්වා වසර 03 කට අධික කාලයක් තිස්සේ නිරවුල් කර නොතිබුණි. මේ පිළිබඳව විනය පරීක්ෂණයක් සිදු කර තිබුණද 2016 මැයි 31 දක්වා මෙම මුදල් අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 4.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

උසස් අධ්‍යාපන අමාත්‍යංශයේ නේවාසිකාගාර 60 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ, ඉදිකිරීම් නිම කර 2015 පෙබරවාරි 23 දින විශ්වවිද්‍යාලයට භාර දී තිබූ පිරිවැය රු.219,998,912 ක් වූ නේවාසිකාගාර ගොඩනැගිල්ල සම්බන්ධයෙන් 2016 අප්‍රේල් 27 දින සිදු කරන ලද භෞතික පරීක්ෂාවේදී බිත්ති පුපුරා තිබූ අතර මළපවාහන පද්ධතියේ කාන්දු වීම් ඇතුළුව අඩුපාඩු රැසක් නිරීක්ෂණය වුවද වගකීම් කාලය තුළ කොන්ත්‍රාත්කරු වෙතින් එකී අඩුපාඩු සකස් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අධ්‍යයන කාර්ය මණ්ඩලයේ හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පිළිවෙලින් 98 ක හා 124 ක පුරප්පාඩු පැවතුණි. මේ හේතුවෙන් වර්ෂය තුල බාහිර කථිකාචාර්යවරුන් වෙත රු.35,369,489 ක් ගෙවා තිබූ අතර අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි පුරප්පාඩු සඳහා කාර්ය පැවරුම් පදනම මත හා දෛනික වැටුප් ගෙවීමේ පදනම මත පුහුණුවන්නන් 37 දෙනෙකු බඳවා ගෙන තිබුණි.

## 4.6 අරමුදල් ඌන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට පර්යේෂණ ප්‍රදාන අරමුදල් ශේෂය රු.12,202,459 ක් පැවතියද වර්ෂය තුළ රු.1,744,545 ක් පමණක් උපයෝජනය කර තිබීම නිසා එම ශේෂයෙන් සියයට 86 ක් වර්ෂය තුළ උපයෝජනය නොකර නිෂ්ක්‍රීයව පැවතුණි.

තවද වෛද්‍ය පීඨය විසින් ක්‍රියාත්මක කරන බාහිර ව්‍යාපෘති 03 ක් සඳහා බාහිර ආයතන වලින් රු.38,027,883 ක් ලැබී තිබූ අතර 2015 දෙසැම්බර් 31 වන විට මුළු වියදම රු.24,381,516 ක් විය. වෛද්‍ය පීඨය මඟින් මේ සම්බන්ධයෙන් කාර්යසාධන වාර්තා පවත්වා නොතිබුණු බැවින් ව්‍යාපෘති වල කාර්යසාධනය සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට නොහැකි විය.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට තෑගි අරමුදල් 12 කට අදාල එකතුව රු.3,664,468 ක් වූ ආදායම් ශේෂ සහ ශිෂ්‍යත්ව අරමුදල් 07 කට අදාල එකතුව රු.504,687 ක් වූ ආදායම් ශේෂ 2009 වර්ෂයේ සිට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි.

# 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 5.1 ක්‍රියාකාරී සැලැස්ම

ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය තුළ ප්‍රධාන ක්‍රියාකාරකම් 979 ක් ඉටු කිරීමට අපේක්ෂා කළ නමුත් ඉන් ක්‍රියාකාරකම් 365 ක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර කෙරීගෙන යන ක්‍රියාකාරකම් ගණන 255 කි.

## 5.2 අභ්‍යන්තර විගණනය

විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශය නිළධාරීන් 06 දෙනෙකුගෙන් සමන්විත වී තිබූ අතර එම අංශය වෙත කැලණිය විශ්වවිද්‍යාලයට අතිරේකව ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය සහ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය යන අනුබද්ධිත ආයතන වල විගණන කටයුතු හා අභ්‍යන්තර විගණන වැඩ සටහන අනුව අර්ථ සාධක, පාරිතෝෂික, විශ්‍රාම වැටුප් ගෙවීම් සහ කොන්ත්‍රාත් ගෙවීම් පිළිබඳ පූර්ව විගණන කටයුතු පැවරී තිබුණි. අභ්‍යන්තර විගණන අංශය තම කාර්යයන් පිළිබඳව වගකිව යුත්තේ අදාල විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වෙත හා අදාල ආයතන වල අධ්‍යක්ෂවරයා වෙතයි.

කාර්ය මණ්ඩලයේ කාලයෙන් සියයට 61 ක් පූර්ව විගණන කටයුතු සඳහා වෙන් කර තිබුණු අතර අනෙකුත් විගණන කටයුතු සඳහා වෙන් කර තිබුණේ සියයට 39 ක කාලයක් පමණි. තවද වෘත්තීය සුදුසුකම් සහිත නිලධාරීන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ද බඳවා ගෙන නොතිබුණි.

## 5.3 අයවැය ලේඛනමය පාලනය

2015 වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය 2016 පෙබරවාරි 09 වන දින නැවත සංශෝධනය කර තිබූ බැවින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන තිබුණේ දැයි විගණනයේදී සෑහීමකට පත් විය නොහැකි විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විශ්වවිද්‍යාල උපකුලපතිවරයාගේ අවධානයට වරින් වර යොමුකරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ස්ථාවර වත්කම් පාලනය | වත්කම් ප්‍රත්‍යාගණනය කර සාධාරණ වටිනාකම ගිණුම් ගත නොකිරීම.<br>ඉඩම් දේපළ වල අයිතිය පවරා නොගැනීම. |
| (ආ) පුස්තකාල පාලනය | පුස්තකාල පොත් සමීක්ෂණය නොකිරීම.<br>පරිශීලනය සඳහා ලබා දුන් පොත් නැවත ලබා ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඇ) කොන්ත්‍රාත් පාලනය | ඉදිකිරීම් ප්‍රමාද වීම.<br>කාලය දීර්ඝ කරවා දඩ මුදල් අය නොකිරීම.<br>වගකීම් කාලය තුළ අළුත්වැඩියා සිදු කර ගැනීමට කටයුතු කර නොතිබීම. |
| (ඈ) අත්තිකාරම් පාලනය | කාර්යය නිම වූ වහාම අත්තිකාරම් පියවීමට කටයුතු නොකිරීම.<br>සාවද්‍ය බිල් පත් මගින් අත්තිකාරම් පියවීම. |